#mediaethicsSL #SinhalaPress #lka #Divaina #October14

බාලවයස්කරුවෙකුට කිසිදු ගැහැටකින් හෝ අනවශ්‍ය අත පෙවීමකින් තොරව තම පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීමට ඇති අයිතිය පිළිබඳවද මාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වේ. ලිංගික අපයෝජනයකට ලක්වූ බාලවයස්කරුවෙකුගේ අනන්‍යතාවය හෙළිදරව්‌ නොකළ යුත්තේද එම පදනම මත පිහිටමිනි. කෙසේ නමුත් ඇතැම් පුවත්පත් මගින් සිදුකරනුයේ බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය සඳහන් නොකරමින්, අපරාධකරුගේ/සැකකරුගේ අනන්‍යතාවය හෙළිදරව්‌ කිරීමත්, අපරාධකරුට/සැකකරුට බාලවයස්කාර වින්දිතයාගේ ඥාතීත්වය හෙළිදරව්‌ කිරීමත් වේ. දිවයින පුවත්පත මගින් ඉදිරිපත් කොට ඇති මෙම ප්‍රවෘත්තිය ඊට උදාහරණයකි. මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් නොවේද? මෙම බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය හෙළිදරව්‌ කිරීමට මෙම පුවත්පත් වාර්තාවෙන් සහායක් ලබා නොදෙන්නේද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?